සිංහල රීතිය - 6

# පද සන්ධි


දේශමාන්‍ය
සාහිත්‍ය සූරී
සම්මානිත මහාචාර්ය

**ජේ. බී. දිසානායක**

කොළඹ විශ්වවිද්‍යාලය


(C) Sumitha Publishers

**සුමිත පොතක්**

සිංහල රීතිය - 6

# පද සන්ධි


ප්‍රථම මුද්‍රණය 2013



© ජේ. බී. දිසානායක



**ISBN 978-955-0335-58-9**

කවරය:

සමන් සිරිවර්ධන

කතුවරයාගේ ඡායාරූපය:
චතුර එස්. කොඩිකාර

ප්‍රකාශනය:

**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com
www.sumithabooks.com

මුද්‍රණය:

SRIDEVI

**ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,**
27, පැපිලියාන පාර,
නැදිමාල, දෙහිවල
දුරකථනය : 2716709



(C) Sumitha Publishers

# සිංහල රීතිය

සමාජය යනු මිනිසුන්ගේ එකතුවකි. සමාජයක යහ පැවැත්ම රඳා පවතින්නේ මූලික කරුණු දෙකක් මත ය. පළමුවැන්න, එහි පවත්නා 'නීති' සමුදාය යි. දෙවැන්න, එහි පවත්නා 'රීති' සමුදාය යි. නීතියක් රීතියක් නැති සමාජය අවුලින් අවුලට පත් වේ. නීති හා රීති අතර පවත්නා මූලික වෙනස්කම් හඳුනා ගැනීම භාෂාවේ ස්වභාවය හඳුනා ගැනීමට මහත් සේ උපකාරි වේ.

විවාහය පිළිබඳව නීති පද්ධතියක් මෙන් ම රීති පද්ධතියක් ද ඇත. විවාහ වන දෙදෙනාගේ වයස් සීමාව ගැන නීතියක් ඇත. විවාහ වන දා මනමාලිය පෝරුවෙහි සිට ගත යුත්තේ කෙසේ ද යන්න ගැන නීතියක් නැත. එහෙත් ඈ සිට ගත යුත්තේ මනමාලයාගේ වම් අත පැත්තෙහි ය යනුවෙන් රීතියක් ඇත. විවාහ වන දාට 'ජය මංගල ගාථා' කියා ආශීර්වාද කළ යුතු යැයි නීතියක් නැතත් රීතියක් ඇත.

නීති හා රීති අතර මූලික වෙනස්කම් තුනක් දක්නට ලැබේ. පළමුවැන්න, නීති හා රීති උපදින ආකාරය යි. නීතියක් උපදින්නේ එය කිසියම් බලධර මණ්ඩලයක් විසින් පනවනු ලැබීමෙනි. මේ බලය බොහෝ විට පැවරෙන්නේ පාර්ලිමේන්තුවට හෙවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ය. රීතියක් උපදින්නේ පාර්ලිමේන්තුව වැනි බලධර මණ්ඩලයකින් නොව මුළු මහත් සමාජයෙනි. මඟුල් පෝරුවේ සිරිත් විරිත් සම්මත කොට ගෙන ඇත්තේ ආඥා පනතකින් නොව මුළු මහත් සමාජය විසිනි.

දෙවැන්න, නීති හා රීති සංග්‍රහ කොට ඇති ආකාරය යි. සමාජයකට බල පාන ඒ ඒ නීති කිසියම් ලේඛනයක සංග්‍රහ කොට ඇත. විවාහයට අදාළ සියලු නීති විවාහ ආඥා පනතෙහි ලේඛනගත කොට ඇත. වගන්ති හා උපවගන්ති වශයෙන් ඒ නීති ඉදිරිපත් කෙරේ. එහෙත් විවාහයට අදාළ සිරිත් විරිත් හෙවත් රීති ඇතුළත් ලේඛනයක් නැත.

තෙවැන්න, නීති හා රීති උල්ලංඝනය කළ විට ඇති වන විපාක යි. නීතියක් බින්ද විට එය දඬුවම් ලැබිය යුතු වරදක් වේ. දඬුවම් පැමිණවීම පොලිසියෙහිත් උසාවියෙහිත් කාර්ය භාරය යි. එහෙත් රීතියක් බිඳුණු විට පොලිසියෙන් හෝ උසාවියෙන් දඬුවම් පැමිණෙන්නේ නැත. මඟුලක් නොකා විවාහයක් කර ගත හොත් ඉන් පොලිසියට ප්‍රශ්නයක් නැතත් සමාජයට ප්‍රශ්නයක් ඇත. එසේ කරන්නට ඇත්තේ ඇයි දැයි සමාජය විමසන්නට පටන් ගනී. ඒ අනුව නොයෙක් කටකතා පැතිර යනු ඇත. එයින් වන අපහාසය උසාවියෙන් ලැබෙන දඬුවමට වඩා බරපතල විය හැකි ය.

භාෂාව සැදී ඇත්තේ නීති පද්ධතියකින් නොව **රීති පද්ධතියකින්** බව අවධාරණය කළ යුතු ය. සිංහලයෙහි අකුරු යෙදිය යුත්තේ මෙසේ යැයි කියා හෝ පද සන්ධි කළ යුත්තේ මෙසේ යැයි කියා හෝ පද හෝ වාක්‍ය සදා ගත යුත්තේ මෙසේ යැයි කියා හෝ නීතියක් නැත. එසේ කළ යුත්තේ අසවල් ආඥා පනතෙහි එන අසවල් වගන්තිය අනුව යැයි කිව නොහේ.

එසේ වුවද නිවැරදිව අකුරු යෙදිය යුතු ආකාරය (අක්ෂර වින්‍යාසය), පද සන්ධි කළ යුතු ආකාරය (අක්ෂර සංයෝගය), පද සදා ගත යුතු ආකාරය (පද සාධනය) හා වාක්‍ය සදා ගත කළ යුතු ආකාරය (වාක්‍ය සාධනය) පිළිබඳව රීති පද්ධතියක් ඇත. මේ රීති පනවන ලද්දේ බලධරයන් විසින් නොව භාෂාව භාවිත කරන්නන් විසිනි.

භාෂාවක භාවිතය අළලා පවතින රීති පද්ධතිය 'ව්‍යාකරණය' නම් වේ. මේ රීති කලින් කලට වෙනස් වෙමින් පරිණාමයට පත් වේ. එබැවින් ඒ ඒ කාල පරිච්ඡේදවල පවත්නා ව්‍යාකරණ රීති කවරේ දැයි ව්‍යවහාරානුසාරයෙන් විමසා බැලීම වාග්විද්‍යාඥයාගෙත් ව්‍යාකරණඥයාගෙත් වගකීම වේ.

'සිංහල රීතිය' නමැති මේ පොත් පෙළේ අරමුණ සමකාලීන සමාජයෙහි සිංහල භාෂාව භාවිත වන ආකාරය විද්‍යාත්මකව විමසා බලා ඊට අදාළ රීති සමුදාය කෙබඳු දැයි විධිමත්ව හෙළි පෙහෙළි කිරීම යි. එසේ කිරීමෙන් සමකාලීන සිංහලයන් සිතන පතන ආකාරය හඳුනා ගැනීමට සිංහල පාඨක ලෝකයාට හැකි වනු ඇත.

(C) Sumitha Publishers

# පෙර වදන

'පද සන්ධි' නමැති මේ පොත 'සිංහල රීතිය' නමැති පොත් පෙළේ හයවැන්න යි. මෙහි අරමුණු දෙකක් තිබේ.

පළමුවැන්න, එක ළඟ යෙදෙන පද දෙකක් එක පදයක් සේ **සන්ධි කළ යුතු සැටි** කියා දීම යි. දෙවැන්න, මේ වන විට සන්ධි වී යෙදෙන සමහර පද **විසන්ධි කළ යුතු සැටි** කියා දීම යි.

මේ පොත කොටස් සතරකින් යුක්ත ය. පළමුවැන්න 'සන්ධි' යනු කෙබඳු ව්‍යාකරණාංගයක් දැයි පැහැදිලි කොට දීම යි. 'සන්ධි' ගැන මුලින් ම සඳහන් වන්නේ දහතුන්වෙනි සියවසෙහි දී ලියවුණු 'සිදත් සඟරාව' නමැති පොතෙහි ය. එහි 'සඳ' යනුවෙන් හැඳින්වෙන මේ වියරණ විදිය 'පෙර අකුරු වණන් නිසි විදිනි ගැළපෙනු සඳ නම්' යනුවෙන් නිර්වචනය කොට ඇත.

දෙවෙනි කොටසින් කෙරෙන්නේ 'සන්ධි' අරබයා මෙතෙක් පළ වී ඇති විවරණ හා විමර්ශන කෙබඳු දැයි කෙටියෙන් හඳුන්වා දීම යි. නව දෘෂ්ටි කෝණයකින් 'සන්ධි' දෙස බලා ඉදිරිපත් කෙරුණු විමර්ශන අතුරින් ඩබ්ලිව් එෆ් ගුණවර්ධන, කුමාරතුංග මුනිදාස, ශ්‍රීනාත් ගණේවත්ත හා සඳගෝමී කෝපරහේවා යන වියතුන්ගේ නව විමර්ශන පිළිබඳව කෙටි හැඳින්වීම් මෙහි ඉදිරිපත් කෙරේ.

තෙවෙනි කොටස 'සන්ධි විධි' පිළිබඳ විමර්ශනයකි. එහි දී සාධක තුනක් මත සන්ධි විධි විග්‍රහයට භාජන කෙරේ. සන්ධියෙහි දී සිදු වන්නේ කුමක් ද යන කරුණ පළමුවෙනි සාධකය යි. ඒ අනුව සන්ධි සියල්ල සතර වර්ගයකට වෙන් කෙරේ. අක්ෂර සන්ධි, ලෝප සන්ධි, ආදේශ සන්ධි හා ආගම සන්ධි යනුවෙනි.

මේ සන්ධි සිදු වන්නේ කතා බහේ ද ලිවීමෙහි ද යන කරුණ දෙවෙනි සාධකය යි. ඒ අනුව සන්ධි විධි දෙ වැදෑරුම් ය. 'භාෂණ සන්ධි' හා 'ලේඛන සන්ධි' යනුවෙනි. මේ පොතෙහි විමර්ශනයට භාජන වන්නේ **'ලේඛන සන්ධි විධි '**පමණකි.

මේ සන්ධි සිදු වන්නනේ පද දෙකක් අතර ද එක ම පදයක කොටස් දෙකක් හෙවත් පදාණු දෙකක් අතර ද යන කරුණ තුන්වෙනි සාධකය යි. ඒ අනුව සන්ධි විධි දෙ වැදෑරුම් ය. 'පද සන්ධි' හා 'පදාණු සන්ධි' යනුවෙනි. මේ පොතෙහි විමර්ශනයට භාජන වන්නේ ලේඛන ව්‍යවහාරයෙහි එන **'පද සන්ධි'** පමණකි.

මේ සන්ධි විධිවලට හසු වන්නේ සිංහලයෙහි පද්‍ය ව්‍යවහාරය ද ගද්‍ය ව්‍යවහාරය ද යන කරුණ සතරවෙනි සාධකය යි. ඒ අනුව සන්ධි විධි දෙ වැදෑරුම් ය.'පද්‍ය සන්ධි' හා 'ගද්‍ය සන්ධි' යනුවෙනි. මේ පොතෙහි මේ සන්ධි දෙ වර්ගය ගැන ම තොරතුරු ඉදිරිපත් කෙරේ. මුලින් ම පද්‍ය සන්ධිත් දෙවනුව ගද්‍ය සන්ධිත් නිදසුන් සහිත ව පැහැදිලි කෙරේ. මෙහි දී 'පද්‍ය සන්ධි' විධි 5 ක් ද 'ගද්‍ය සන්ධි විධි' 10 ක් ද ඉදිරිපත් කෙරේ.

**ජේ. බී. දිසානායක**

2, ඒ. පීටර්ස් පෙදෙස

නුගේගොඩ

(C) Sumitha Publishers

# පටුන


1. සන්ධි 7
2. සඳ හා සන්ධි 8
3. සන්ධි විමර්ශන 10
4. සන්ධි : ගුණවර්ධන විග්‍රහය 12
5. සන්ධි : කුමාරතුංග විග්‍රහය 14
6. සන්ධි : ගණේවත්ත විග්‍රහය 16
7. සන්ධි : සඳගෝමී අකාරාදිය 18
8. සන්ධි විධි 20
9. භාෂණ සන්ධි හා ලේඛන සන්ධි 22
10. පද සන්ධි හා පදාණු සන්ධි 24
11. පද්‍ය සන්ධි හා ගද්‍ය සන්ධි 26
12. සන්ධි නාමාවලිය 28
13. අක්ෂර සන්ධිය 30
14. ස්වර ලෝප සන්ධිය 34
15. පර රූප සන්ධිය 40
16. පූර්ව රූප සන්ධිය 42
17. ගාත්‍රාදේශ සන්ධිය 43
18. ආ-කාර ආදේශ සන්ධිය 45
19. ඊ-කාර ආදේශ සන්ධිය 55
20. උෟ-කාර ආදේශ සන්ධිය 56
21. ඒ-කාර ආදේශ සන්ධිය 57
22. ඕ-කාර ආදේශ සන්ධිය 59
23. ය-කාර ආදේශ සන්ධිය 64
24. ව-කාර ආදේශ සන්ධිය 66
25. පූර්ව අ-කාර ලෝප සන්ධිය 67
26. අපර අ-කාර ලෝප සන්ධිය 75
27. ආ-කාර ලෝප සන්ධිය 78
28. සන්ධි හා විසන්ධි 80


(C) Sumitha Publishers

# කතුවරයාගේ භාෂා පොත්

**භාෂාව**

භාෂාවක රටා සමුදාය
භාෂාවක භාවිතය හා විග්‍රහය
මානව භාෂා ප්‍රවේශය

**සිංහල ව්‍යාකරණය**

සමකාලීන සිංහලය : ශබ්ද විචාරය
නූතන සිංහල ලේඛන ව්‍යාකරණය:
  1. අක්ෂර වින්‍යාසය
සමකාලීන සිංහල ලේඛන ව්‍යාකරණය:
  1. ව්‍යාකරණ ප්‍රවේශය
  3. සන්ධි විග්‍රහය

සිංහල භාෂාවේ නව මුහුණුවර

සිංහල අක්ෂර විචාරය
අක්ෂර වින්‍යාස ප්‍රවේශය
නයනු ණයනු වින්‍යාසය

**'සිංහල රීතිය' පොත් පෙළ**

සිංහල අක්ෂර මාලාව
සිංහල අක්ෂර හා අක්ෂරාණු
'ණ' කාර වින්‍යාසය
'ළ' කාර වින්‍යාසය
අක්ෂර වින්‍යාසය
පද සන්ධි
පද නිර්මාණය

**'පුංචි අපට සිංහල' පොත් පෙළ**

සරල සිංහල හෝඩිය
මිශ්‍ර සිංහල හෝඩිය
මහාප්‍රාණ අක්ෂර
'ණ' යෙදෙන හැටි
'ළ' යෙදෙන හැටි

**'සිංහල ජන වහර' පොත් පෙළ**

සිංහල ජන වහර
ගමක සුවඳ සිව් සිය ගවු ඇසේයා
හඬ වටා පද රටා
සියලඟ රූ සොබා
කිච්චම මොකද
උඩරට සිංහලය

**'අකුරු මිහිර' පොත් පෙළ**

අකුරු මිහිර - 1
අකුරු මිහිර - 2
අකුරු මිහිර - 3
අකුරු මිහිර - 4
අකුරු මිහිර - 5
අකුරු මිහිර වැඩ පොත - 1

**සිංහල භාෂාව පිළිබඳ ඉංග්‍රීසි පොත්**

Language and Commonsense
National Languages of Sri Lanka: 1. Sinhala
Say it in Sinhala
The Structure of Spoken Sinhala:
  1. Sounds and Their Patterns
Sinhala : A Unique Indo-Aryan Language
Encyclopaedia of Sinhala Language and Culture
Sinhala-English School Dictionary -1 Simple Adjectives

**'Lets Learn Sinhala' Series**

1. Vowels and Consonants
2. Vowels and Their Strokes
3. Consonants and Their Ways
4. Special Letters and Strokes

(C) Sumitha Publishers

# 1
# සන්ධි

**'සන්ධි'** යන පදය සිංහල අපට නුහුරු පදයක් නොවේ. යම් යම් දේවල් 'සන්ධි කරනවා' හෝ 'විසන්ධි කරනවා' වැනි වහර දැන් අපට හොඳට හුරු ය. මහ මඟ ඇති 'මං සන්ධි' හා 'කඩ සන්ධි' හැරුණු විට ජීවින ගමන් මඟෙහි ඇති 'සන්ධි ස්ථාන' ගැන ද අපට නිතර අසන්ට ලැබේ.

**'සන්ධි'** යන පදය භාෂා ව්‍යවහාරයට ද සම්බන්ධ ය. කථා කරන විට හෝ ලියන විට හෝ එක ළඟ යෙදෙන පද දෙකක් එක් පදයක් සේ මනාව ගැළපෙන ආකාරයෙන් එක් වීම හෝ එක් කිරීම 'සන්ධි' යනුවෙන් අදහස් කෙරේ. මෙය සංස්කෘත හා පාලි වැනි භාෂාවල ද දක්නට ලැබෙන්නකි.

කතා බහේ දී පද දෙකක් සන්ධි වන්නේ නිරායාසයෙනි. එයින් උච්චාරණ පහසුව සැලසෙන නිසා ය. ලියන විට පද දෙකක් සන්ධි කරන්නේ වුවමනාවෙන් හෙවත් සිතා මතා ය. එයින් පිටුවේ ඉඩ ඉතුරු කොට ගත හැකි නිසා ය. ලියන විට ඇතැම් පද සන්ධි කොට හෝ නොකොට හෝ ලිවීමේ නිදහස ලේඛකයාට ඇත.

සන්ධි පිළිබඳව අපට මුලින් ම දැන ගන්ට ලැබෙන්නේ පාසල් වියෙහි දී ය. 'සන්ධි පාඩම' සිංහල ගුරුවරුන්ගේ පාඩම් මාලාවෙහි අනිවාර්ය අංගයක් බවට පත් වී ඇත. ඒ ඒ සන්ධි විධි අරබයා ගුරුවරුන් දෙන නිදසුන් කටපාඩම් කර ගත් විට විභාගයෙන් සමත් විය හැකි ය.

සිංහල ගුරුවරයා සන්ධි පිළිබඳ තොරතුරු ලබා ගන්නේ සිංහල පඬිවරුන් ලියා ඇති 'සිංහල ව්‍යාකරණ' නමැති පොත්වලිනි. ඒ පඬිවරුන් ඒ තොරතුරු ලබා ගන්නේ 'සිදත් සඟරාව' නම් පොතෙනි.

'සිදත් සඟරාව' යනු අදට අවුරුදු හත් සීයකට පමණ ඉහත දී ලියූ පොතකි. එය ලියන ලද්දේ කවි ලියන්ට කැමති නවකයන්ගේ දැන ගැනීම සඳහා ය. එදා කවි ලියූවන් විසින් අවශ්‍යයෙන් ම දත යුතු එක් මූලික කරුණක් විය. ඒ කරුණ නිදසුන් දෙමින් පැහැදිලි කර දීම සිදත් සඟරාවේ අරමුණ විය.

(C) Sumitha Publishers

එදා කවීන් විසින් දත යුතු වූ මූලික කරුණ නම් කවි ලිවීම සඳහා වෙන ම බස් වහරක් ඇති බව යි.මේ බස් වහර එදා කතා බහේ දීත් ගද්‍ය රචනයෙහි දීත් යෙදුණු බස් වහරට වඩා වෙනස් වූවකි. මේ බස් වහර හැඳින්වීමට සිදත් සඟරා කතුවරයා යෙදුවේ **'කව් ලැකිය'** යන නම යි.

කත බහ වැනි එදිනෙදා කටයුතු සඳහාත් ගද්‍ය රචනය සඳහාත් යෙදා ගත් බස වහර හැඳින්වුණේ **'ලෙව් ලැකිය'** යන නමිනි. ගද්‍ය රචනය සඳහා කව් ලැකිය ද යොදා ගත හැකි වුණත් පද්‍ය රචනය සඳහා ලෙව් ලැකිය යොදා ගත නොහැකි විය. එබැවින් එදා හොඳ කවියෙකු වූයේ කව් ලැකියෙන් කවි බඳින්ට දත් කවියා පමණකි.

කව් ලැකියට අයත් රීති පද්ධතියේ වැදගත් තැනක් ලැබුණේ 'සන්ධි' නම් ව්‍යාකරණ රීතියට ය.

# 2
# සඳ හා සන්ධි

**'සන්ධි'** පිළිබඳව සිංහලයෙහි එන මුල් ම විවරණය හමු වන්නේ 'සිදත් සඟරාව' නම් කෘතියෙහි ය. පද්‍ය රචනය සඳහා ඊට ම සුවිශේෂී වූ **'කව් ලැකියක්'** ඇති බව පෙන්වා දෙන මේ පොත කවි ලැකියට සුවිශේෂී වණු ව්‍යාකරණ රීති පද්ධතියක් ද ඇති බව පෙන්වා දෙයි.

මේ පොතේ අරමුණ වූයේ නවකයන්ගේ දැන ගැනීම පිණිස **'කව් ලැකිය'** හඳුන්වා දීම වූ නිසා ඒ පොත ලියන ලද්දේ ද කවි ලැකියෙන් ම ය. එය ලියුවේ එදා භාවිත වුණු ලෙව් ලැකියෙන් නම් ඒ පොත නම් කළ යුතු ව තිබුණේ 'සිද්ධාන්ත සංග්‍රහය' යනුවෙනි.

(C) Sumitha Publishers

කව් ලැකිය ලෙව් ලැකියෙන් වෙනස් කළ මූලික ලක්ෂණය නම් සංස්කෘතයෙන් හෝ පාලියෙන් ගත් **'තත්සම පද'** කව් ලැකියෙහි භාවිත නොවීම යි. කෝට්ටේ යුගයෙන් පසු ව බිහි වුණු සිංහල කවියන් පද්‍ය රචනය සඳහා ද සංස්කෘත හා පාලි පද යොදා ගත්තත් එතෙක් බිහි වුණු කිසිදු සිංහල කවියෙකු පද්‍යකරණයට ලෙව් ලැකිය යොදා ගත්තේ නැත.

මේ නිසා පැරණි ම සිංහල පද්‍ය කෘති නම් කොට ඇත්තේ 'සිය බස් ලකර' 'මුව දෙව් දා වත' 'සස දා වත' හා 'කව් සිළු මිණ' යනුවෙන් කව් ලැකියෙනි. එහෙත් එවක හුන් ගද්‍ය රචකයෝ ලෙව් ලැකියෙන් ගත් 'ධර්ම ප්‍රදීපිකාව' 'සද්ධර්ම රත්නාවලිය' 'සද්ධර්ම රත්නාකරය' හා 'සද්ධර්මාලංකාරය' වැනි නම්වලින් සිය කෘති හැඳින්වූහ.

කව් ලැකිය ලෙව් ලැකියෙන් වෙනස් වන 'වියරණ විදි' 20 ක් කෙරේ සිදත් සඟරාව අවධානය යොමු කරයි. 'සන්' 'සඳ' 'ලිඟු' 'විබත්' 'සමස්' යනු විසින් කවි ලැකියෙන් ම මේ 'විසි වැදෑරුම් වියරණ විදි' හඳුන්වා දෙන කතුවරයා එහි දෙවෙනි තැන දෙන්නේ 'සඳ' නම් වූ වියරණ විදිය අරබයා ය.

මෙහි **'සඳ'** යනුවෙන් කවි ලැකියෙන් හැඳින්වෙන වියරණ විධිය සංස්කෘත හා පාලි ව්‍යාකරණ ග්‍රන්ථවල හඳුන්වා ඇත්තේ ලෙව් ලැකියෙහි එන **'සන්ධි'** නම් පදයෙනි. පද්‍ය රචනයෙහි හමු වන සන්ධි විධි 9 ක් සිදත් සඟරාවෙහි විස්තර වේ.

එක් එක් සන්ධි විධියක් අරබයා මෙහි දක්වා ඇති හැම නිදසුනක් ම උපුටා ගෙන ඇත්තේ එතෙක් බිහි වී තිබූ පද්‍ය කෘතිවලිනි. ඒ අතර 'මුවදෙව්දාව' 'සසදාව' හා 'කව්සිළුමිණ' වැනි කාව්‍ය ද දැනට අවිද්‍යමාන 'කුසදා කව' 'අසක්දා කව' 'මියුරු සඳෙස' හා 'වෙසතුරු දාව' වැනි කාව්‍ය ද වේ. 'පෙර සර ලොප් සඳ' නම් සන්ධි විධිය පැහැදිලි කිරීමට ඉදිරිපත් කොට ඇත්තේ කව් ලැකියෙහි ආ පහත දැක්වෙන පද යි.

| | |
|---|---|
| විදුරුවියේ | දිගා |
| දිනිසුරු | කනිල් |
| බමරුදුළ | නොමරුළ් |
| සදෙව් | යළේහි |
| පහරොත | හඬෝනා |

මේ නිදසුන්වලට විශේෂ වුණු ලක්ෂණය නම් 'මහාප්‍රාණ' වැනි අක්ෂර ඒ පදවල භාවිත නොවීම යි. කවි ලැකිය මහාප්‍රාණ අක්ෂර බැහැර කරන හෙයිනි. සිදත් සඟරාවෙහි එන හෝඩිය අක්ෂර 30 කට සීමා වූවකි. ඒ අවධියෙහි කවි ලැකියෙන් පද්‍ය ලියූ ලේඛකයන්ට මේ නිදසුන් පහසුවෙන් වටහා ගත හැකි විණ.

(C) Sumitha Publishers

සිදත් සඟරාව ඉදිරිපත් කරන සන්ධි විධි කවි ලැකියෙන් නම් කොට ඇත්තේ මෙසේ ය.

1. පෙර සර ලොප් සඳ
2. පර සර ලොප් සඳ
3. සර සඳ
4. සරදෙස් සඳ
5. ගතදෙස් සඳ
6. පෙර රූ සඳ
7. ගතකුරු ලොප් සඳ
8. අගම් සඳ
9. දෙ රූ සඳ

අද පාඨශාලාවල ඉගන්වෙන 'සන්ධි පාඩමට' බොහෝ විට පදනම් වී ඇත්තේ සිදත් සඟරාවෙහි එන මේ සන්ධි විධි හා නිදර්ශන යි. සමහර විට **'පෙර රූ සඳ'** නම් සන්ධි විදිහට අනුරූප වන පරිදි **'පර රූ සඳ'** නමින් අලුත් සන්ධි විධියක් මීට එකතු කොට තිබේ. මේ නිදසුන් කටපාඩම් කර ගන්නා සිසු සිසුවියෝ ඒවා විභාගයෙහි දී ඉදිරිපත් කොට සමත් වෙති. ගුරුවරු ද දරුවන්ගේ සමත්කම් බලා සතුටට පත් වෙති.

එහෙත් ඇත්ත එය නොවේ. මේ තොරතුරු කටපාඩම් කර ගැනීමෙන් සිංහල භාෂාවේ සන්ධි ව්‍යවහාරය පිළිබඳ පූර්ණ අවබෝධයක් ඔවුන්ට ලැබෙන්නේ නැත. දෙ කරුණක් නිසා ය. පළමුවැන්න, පැරණි කවි පොත්වලින් ගත් මේ පද අද බොහෝ දෙදෙනෙකුට වැටහෙන්නේ නැත. දෙවැන්න, **'ගද්‍ය'** කෘතිවල එන සන්ධි ගැන ඔවුන්ට හැඟීමක් නැත.

අනාගතයෙහි දී හොඳ ලේඛකයෙකු වීමට බලාපොරොත්තු වන දරුවෙකුට අවශ්‍ය වන්නේ නූතන ලේඛකයන් සිය ලේඛනවල පද සන්ධි කරන සැටි දැන ගැනීම යි. වර්තමාන ලේඛකයන් ද පද්‍ය රචනා කළත් එදා භාවිත වුණු කවි ලැකිය අද යෙදෙන්නේ නැත.

අද ලේඛකයන් වැඩි දෙනාගේ අවධානය යොමු වී ඇත්තේ නවකථා හා කෙටිකතා වැනි ප්‍රබන්ධ කථාත් ශාස්ත්‍රීය නිබන්ධත් වැනි ගද්‍ය කෘති නිර්මාණය කෙරෙහි ය. එබැවින් 'සිංහල පාඩම' දරුවන්ට වැඩ සැලසෙන පරිදි යාවත්කාලීන කිරීමට දැන් කල් පැමිණ තිබේ. මේ පොත ඊට රුකුලක් වනු ඇත.

# 3

# සන්ධි විමර්ශන

'සන්ධි' නමැති ව්‍යාකරණ විධිය හැම සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක ම අවධානයට හසු වුණු භාෂා ව්‍යවහාර විධියකි. ඒ පිළිබඳ මුල් ම විවරණය හමු වන්නේ දඹදෙණි යුගයෙහි පළ වුණු 'සිදත් සඟරාව' නමැති කෘතියෙහි ය. අද පළ වන බොහෝ ව්‍යාකරණ පොත්වලට පදනම් වී ඇත්තේ සිදත් සඟරාවෙහි එන විග්‍රහය යි.

සිදත් සඟරා විග්‍රහය අද ඉගැන්වීමෙන් සිංහල බස් වහර පිළිබඳ යථාරූපී අවබෝධයක් ලැබීමට නූතන දරු දැරියෝ අසමත් වෙති. ඊට ප්‍රධාන හේතුව සිදත් සඟරා විග්‍රහය පද්‍ය සිංහල ව්‍යවහාරයට පමණක් සීමා වීම යි. මෙහි කතුවරයාට අවශ්‍ය වූයේ පද්‍යකරණයට පිවිසෙන නවකයන්ට පද්‍ය රචනයෙහි ලා පද යෙදෙන සැටි පැහැදිලි කිරීම විනා ගද්‍ය සිංහල ව්‍යවහාරයෙහි එන සන්ධි විධි කිසිවක් ගැන කීම නෙවේ.

එබැවින් මුළු මහත් සිංහල භාෂාවෙහි භාවිත වන සන්ධි විධි පිළිබඳ පරිපූර්ණ ඥානයක් මේ විග්‍රහයෙන් ලබා ගත නොහැකි ය. ඊට කතුවරයාට දොස් පැවරිය නොහැක්කේ ඔහුගේ පරමාර්ථය වූයේ එවැනි විවරණයක් සැපයීම නුවූ හෙයිනි. එහෙත් එවැනි විග්‍රහයක් පදනම් කොට ගෙන නූතන දරු දැරියන්ට සන්ධි ඉගැන්වීම කනගාටුවට කරුණකි.

සිදත් සඟරාවෙහි එන සියලු නිදසුන් පැරණි සම්භාව්‍ය කාව්‍ය ග්‍රන්ථවලින් උපුටා ගත් ඒවා ය. සන්ධි වූ බොහෝ පද අද ව්‍යවහාරයෙන් ඈත් වී ඇති නිසා ඒවා වටහා ගැනීම නූතන දරු දරියන්ට ඉමහත් ගැටලුවක් වී තිබේ.

පහත දැක්වෙන්නේ ඒ ඒ සන්ධි පැහැදිලි කිරීමට එහි ඉදිරිපත් කොට ඇති පද සමහරකි.

| | |
|---|---|
| විදුරවියේ | කනීල් |
| මොහොර | ලඹෝරා |
| කප්පිල් | ලප්නාරඟ |
| පන්නම් | පිස්සම් |
| වංමුතු | අම්මල් |
| පිරියත් | රුවාරූ |
| වැල්ලවුරු | කුල්ලෙව් |

මේ අතුරින් කීයක් නූතන ගුරුවර ගුරුවරියන්ට හෝ දරු දැරියන්ට තේරේ ද? මේ පද කටපාඩම් කොට ගෙන ගොස් විභාගයට ලියා ලකුණු ගත්තත් ඔවුන්ට සිදු වන සෙත කුමක් ද?

එබැවින් සිදත් සඟරාව පදනම් කොට ගත් සන්ධි විග්‍රහය බොහෝ වියතුන්ගේ විවේචනයට ලක් විණ. ඔවහු සන්ධි අලළා නව විග්‍රහයන් ඉදිරිපත් කළහ. ඒ පිළිබඳව කරුණු මතු දැක්වේ.

(C) Sumitha Publishers